නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!

# ධම්මපදය

## පුප්ඵ වර්ගය (08-09 ගාථාව)

**8. ගාථාව**

**යථාපි රුචිරං පුප්ඵං - වණ්ණවන්තං අගන්ධකං**
**ඒවං සුභාසිතා වාචා - අඵලා හෝති අකුබ්බතො.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **රුචිරං** | - | සිත්කලු වූ |
| **වණ්ණවන්තං** | - | පැහැය ඇති |
| **අගන්ධකං** | - | සුවඳ ඇති |
| **පුප්ඵං** | - | මල |
| **යථාපි** | - | යම් සේ ද |
| **ඒවං** | - | එසේ (ම) |
| **සුභාසිතා වාචා** | - | සුභාෂිත වචනය |
| **අකුබ්බතො** | - | නො කරන්නාට |
| **අඵලා හෝති** | - | වැඩෙක් නොවේ. |

**භාවාර්ථය**

සිත්කලු පැහැයෙන් හා සටහනින් යුත් සුවඳ නැති මල යම් සේ ද එසේ ම සුභාෂිත බුද්ධ වචනය ඉගෙන එලෙස පිළිවෙත් නො පුරන්නාට ඵල රහිත වේ.

**9. ගාථාව**

**යථාපි රුචිරං පුප්ඵං - වණ්ණවන්තං සුගන්ධකං**
**ඒවං සුභාසිතා වාචා - සඵලා හෝති සකුබ්බතො.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **සකුබ්බතො** | - | කරන්නාට |
| **සඵලා හෝති** | - | වැඩ සහිත වේ. |

**නිදන කථාව**

අප බුදුරජාණන් වහන්සේ කාලයෙහි සැවැත්නුවර ත්‍රිපිටකධර අනාගාමී උපාසකතුමෙක් විසීය. ඔහු අත නිතර කුඩයක් විය. එහෙයින් 'ඡත්ත පාණි' නමින් ප්‍රසිද්ධ විය. ඔහු උදැසනින් ම පෙහෙවස් සමාදන් ව බුදුරජාණන් වහන්සේට උවටැන් කරනු පිණිස යයි.

අනාගාමී ආර්ය ශ්‍රාවකයන්ට මාර්ගඥාන ලාභය සමග ම බ්‍රහ්මචරිය වාසය හා ඒක භත්තිකභාවය සිදු වේ. අනාගාමීහු ප්‍රකෘතියෙන් ම ඒකභත්තික වෙති. බ්‍රහ්මචාරී වෙති. ඡත්ත පාණී තෙමේ ද එපරිද්දෙන් උපෝසථික ව බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ බණ අසමින් හුන්නේ ය.

එ දවස, පසේ නදී කොසොල් රජ තෙමේ ද බුද්ධෝපස්ථානයට එහි ගියේ ය. උපාසක තෙමේ එන්නා වූ රජු දැක "හුන් තැනින් නැගී සිටිය යුතු දැයි" සිතා "මම සිටින්නේ අග්‍රරාජයාණන් වූ බුදුරජුන් වෙත ය. එහෙයින් පෙදෙසි රජකු දැක නැගී සිටීම යුතු නොවේ. නො නැගී සිටියහොත් රජු මට කිපෙන්නේ ය. කිපුනත් නැගී සිටීම නම් යුතු නැත. රජු දැක නැගී සිටියහොත් රජුට ගරු කරන ලද්දේ වෙයි. එය බුදුරජාණන් වහන්සේට ගරු නො කිරීමක් සේ පෙනේ. එහෙයින් නො නැගිටින්නෙමි" යි සිතා හුන් තැන ම හුන්නේ ය. නුවණැත්තෝ තමනට වඩා ගරු කළ යුත්තන්

ඉදිරියෙහි දී නො නැගිටින්නෙකු දැක නො කිපෙති. රජ තෙමේ නො නැගිටි උපාසකයා දැක කිපුනේ ය. නමුත් බුදුන් වැඳ පසෙකට වී හුන්නේ ය.

බුදුරජාණන් වහන්සේ රජු කිපී ඇති බව දැක "මහරජ! මේ උපාසක තෙමේ පණ්ඩිතයෙකි. දක්නා ලද ධර්මය ඇත්තෙකි. ත්‍රිපිටකධරය, වැඩ-නො වැඩ දැනීමෙහි පොහොසතෙකි." යි උපාසකයාගේ ගුණ කීහ. ඒ අසා රජුගේ සිත මොළොක් විය.

පසු දින සිය මාළිගයෙහි උඩුමහලෙහි සිටි රජ තෙමේ කුඩය අතට ගෙන වහන් පය ලා රජගේ මිදුලෙන් යන උපාසකයා දැක අඬගා යැවීය. ඔහු කුඩය හා වහන් පසෙක තබා රජු වෙත ගොස් වැඳ සිටියේ ය. "උපාසකය! ඔබ මෙතරම් ගරු සරු සහිත ව පැමිණියේ මා රජු බව දැන ගත්තේ අද ද"යි රජු විචාළේ ය. "නැත දේවයන් වහන්ස!" යි උපාසකතුමා කීය. "එසේ නම් ඊයේ බුදු රජුන් ඉදිරියේ දී කුමක් නිසා මා දැක හුන් තැනින් නො නැගිට්ටහු ද" යි ඇසූ විට "මහරජ! එතැන දී මම නො නැගිට්ටේ ඔබට අගෞරවයට නො වි. එසේ නැගිට්ටේ නම් බුදු රජුන්ට අගෞරවයක් වන්නේ ය" යයි කීයේ ය.

"හා, එය තිබුනාවේ, ඔබ එලොව මෙලොව දෙකෙ හි වැඩ-අවැඩ දන්නාහු ය, ත්‍රිපිටකධරහු ය. මාගේ අන්තඃපුරයෙහි වසන්නන්ට බණ උගන්නව" යි කීය. උපාසක තෙමේ, "මහරජතුමනි, රජගෙවල කටයුතු නම් ඉතා බැරෑරුම් ය. ඒ නිසා මේ වැඩේට සුදුසු භික්ෂූන් වහන්සේ නමක්" යයි කියා සිටියේ ය.

ඉන් පසු රජ තෙමේ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් අන්තඃපුර ස්ත්‍රීන්ට බණ ඉගැන්වීමට ආරාධනා කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේට එය භාර කළහ. ආනන්ද මහාතෙරුන් වහන්සේ ඉන් පසු නිතර රජගෙට වැඩ බිසෝවරුන්ට බණ උගන්වන සේක. ඉන් පසු මල්ලිකා බිසව මනා ව බණ දහම් ඉගෙන ගනී. වාසභ ඛත්තියා බිසෝ තෙමේ සකසා ඉගෙනීම නො කරයි.

එක් දවසක් බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් කැඳවා "බිසෝවරු මනාව බණ උගනිද් ද" විචාළ සේක. මල්ලිකා දේවිය මනාව බණ දහම් ඉගෙන ගන්නා බවත්, වාසභ ඛත්තියා දේවිය දේවිය මනා ව ඉගෙන නො ගන්නා බවත් ආනන්ද තෙරුහු පැවසූහ. "ධර්මය හොඳින් ඉගෙන පුහුණු නො කරන්නා හටත් මැනෙවින් නො දෙසන්නාටත් පැහැයෙන් පමණක් සිත් ගන්නා සුවඳ නැති මලක් සේ ප්‍රයෝජන රහිත ය එයින් වැඩෙක් නැත්තේ ය. එයට ලැදි ව ඉගෙන පුහුණු කොට කියන අසන හැම දෙනාටම මහත්ඵල දෙන්නේ ය. එහි අනුසස් ඉමහත් ය" යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ගාථා වදාළ සේක.

මේ ධර්මදේශනාව අවසානයෙහි බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - ප්‍රණීත අදහස් වලින් හා ගුණ සමූහයෙන් උසස් වීමට සිතිය යුතු ය.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(බිනර 2552)**

<u>සම්පාදක:</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>පිටු සැකසීම:</u> පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

<u>ධර්මදානය:</u> පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**

- *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*